# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2146/3 - 2019 ඔක්තෝබර් මස 21 වැනි සඳුදා - 2019.10.21

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී.බී. 9/2016 (II)

**2015 අංක 5 දරන ජාතික ඖෂධ නියාමන අධිකාරිය පනත**

2015 අංක 5 දරන ජාතික ඖෂධ නියාමන අධිකාරිය පනතේ 118 වන වගන්තිය සමග කියවිය යුතු 142 වන වගන්තිය යටතේ සෞඛ්‍ය, පෝෂණ සහ දේශීය වෛද්‍ය අමාත්‍යවරයා විසින් සාදන ලද නියෝග.

වෛද්‍ය රාජිත සේනාරත්න (පා.ම.),
සෞඛ්‍ය, පෝෂණ සහ දේශීය වෛද්‍ය අමාත්‍ය.

2019 ඔක්තෝබර් මස 11 වැනි දින,
කොළඹ දී ය.

නියෝග

1. මෙම නියෝග 2019, මිල නියම කිරීමේ නියෝග යනුවෙන් හඳුන්වනු ලැබේ.

2. මෙම නියෝගවල (මෙහි මින්මතු "ඖෂධ නිෂ්පාදන" යනුවෙන් සඳහන් කරනු ලබන) ඖෂධ, වෛද්‍ය උපකරණ සහ සීමාස්ථ නිෂ්පාදන වල මිල නියම කිරීම සඳහා සහ ඒ හා සම්බන්ධව මෙම නියෝග අදාළ කරගනු ලැබිය යුතු ය.

3. අධිකාරිය විසින්, ඖෂධ නිෂ්පාදනවල හඳුන්වාදීමේ මිල තීරණය කිරීමේ දී, එකම ප්‍රතිකාරක කාණ්ඩයට අයත් සමාන නිෂ්පාදන වල ශ්‍රී ලංකාව තුළ සහ වෙනත් යම් රටවල පවතින වෙළඳපල මිල, කලාපීය සහ ජාත්‍යන්තර සැසඳුම් මිල ගණන් සහ ඖෂධ නිෂ්පාදනවල පිරිවැය, රක්ෂණය සහ ප්‍රවාහන ගාස්තු සහ අදාළ විනිමය අනුපාතය යන වෙනත් යම් අදාළ මූලාශ්‍ර වල තොරතුරු ඇතුළුව මිල නියම කිරීමේ කමිටුව විසින් තීරණය කරනු ලබන වෙනත් යම් සාධක පිළිබඳ සලකා බලනු ලැබිය යුතු ය.

4. මිල නියම කිරීමේ කමිටුව පහත දැක්වෙන තැනැත්තන්ගෙන් සමන්විත විය යුතු යඃ-

(අ) නිල බලයෙන් පත්වන සාමාජිකයන් -
- (i) ජාතික ඖෂධ නියාමන අධිකාරියේ සභාපතිවරයා;
- (ii) ජාතික ඖෂධ නියාමන අධිකාරියේ ප්‍රධාන විධායක නිලධරයා;
- (iii) පාරිභෝගික කටයුතු අධිකාරියේ නියෝජිතයකු; සහ
- (iv) ජාතික ඖෂධ නියාමන අධිකාරියෙ'ඖෂධවේදියකු;

1A - PG 4713 — 617 (2019/10)
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

(ආ) වෛද්‍ය, ඖෂධවේදය, ආර්ථික විද්‍යාව, වාණිජ්‍යය, ගිණුම්කරණය, නීතිය හෝ වෙනත් යම් ආශ්‍රිත ක්ෂේත්‍රවල නිපුණතාවයක්, පළපුරුද්දක් හෝ හැකියාවක් පෙන්නුම් කර ඇති තැනැත්තන් අතරින් තැනැත්තන් හත්දෙනෙකු.

5. අධිකාරිය විසින්, මිල නියම කිරීමේ කමිටුවේ සභාපතිවරයා ලෙස කමිටුවේ සාමාජිකයන්ගෙන් එක් අයකු පත් කරනු ලැබිය යුතු ය.

6. මිල නියම කිරීමේ කමිටුවේ යම් රැස්වීමක ගණ පූරණය සාමාජිකයන් හත්දෙනෙකු විය යුතු ය.

7. මිල නියම කිරීමේ කමිටුව විසින්, එහි රැස්වීම් සහ ඒ රැස්වීම්වල කටයුතු පැවැත්වීම සම්බන්ධයෙන් වන ස්වකීය කාර්ය පටිපාටිය විධිමත් කරනු ලැබිය හැකි ය.

8. මිල නියම කිරීමේ කමිටුවේ සාමාජිකයන්ට අධිකාරිය විසින් තීරණය කරනු ලැබිය හැකි පරිදි යම් දීමනා ගෙවනු ලැබිය යුතු ය.

9. මිල නියම කිරීමේ කමිටුවේ බලතල සහ කර්තව්‍ය වලට-

(අ) යම් තනි ඖෂධ නිෂ්පාදනයක හෝ ඖෂධ නිෂ්පාදන කාණ්ඩයක මිල තීරණය කිරීමේ දී බලපාන්නා වූ අදාළ තොරතුරු සහ දත්ත ශ්‍රී ලංකාව තුළ හෝ වෙනත් යම් රටවල නිෂ්පාදකයන්ගෙන්, ආනයනකරුවන්ගෙන්, තොග වෙළෙඳුන්ගෙන්, සිල්ලර ඖෂධවේදීන්ගෙන්, ඖෂධ නිර්දේශ කරන්නන්ගෙන්, ඖෂධ නිකුත්කරන්නන් සහ වෙනත් යම් තැනැත්තන්ගෙන් ලබා ගැනීම සඳහා අධිකාරිය වෙත සහාය ලබා දීම;

(ආ) යම් ඖෂධ නිෂ්පාදනයක හෝ ඖෂධ නිෂ්පාදන කාණ්ඩයක මිල අඩු කිරීමක් හෝ වැඩි කිරීමකට හෝ පවතින මිල පවත්වා ගෙන යාමට අධිකාරිය වෙත නිර්දේශ කිරීම;

(ඇ) යම් ඖෂධ නිෂ්පාදනයක මිල උච්චාවචනය වීම අධීක්ෂණය කිරීම;

(ඈ) ශ්‍රී ලංකාව තුළ යම් ඖෂධ නිෂ්පාදනයක් හෝ ඖෂධ නිෂ්පාදන කාණ්ඩයක් භාවිත කිරීම පිළිබඳ දත්ත රැස්කිරීම;

(ඉ) ඖෂධ නිෂ්පාදනවල හඳුන්වාදීමේ මිල සහ උපරිම සිල්ලර මිල සහ ඒ ඖෂධ නිෂ්පාදනවල මිල ප්‍රතිශෝධනයන් පිළිබඳ ක්‍රම අධිකාරිය වෙත නිර්දේශ කිරීම;

(ඊ) යම් ඖෂධ නිෂ්පාදනයක මිල නියම කිරීමට අදාළ වෙනත් යම් කාරණයක් පිළිබඳ අධිකාරිය වෙත උපදෙස් ලබා දීම.

(උ) කලින් කලට, මිල ප්‍රතිශෝධනයන්ට යටත්විය යුතු ඖෂධ නිෂ්පාදන පිළිබඳව සලකා බැලීම.

යන කාරණා ඇතුළත් විය යුතු ය.

10. යම් ඖෂධ නිෂ්පාදනයක ලියාපදිංචි සහතිකය දරන්නා හෝ දේශීය නිෂ්පාදකයා විසින් යම් ලියාපදිංචි කරන ලද ඖෂධ නිෂ්පාදන, ආනයනය කරන ලද හෝ වෙළඳපලට සපයන ලද ප්‍රමාණය පිළිබඳ වාර්තා සෑම මාස හයකට වරක් අධිකාරිය වෙත ඉදිරිපත් කළ යුතු ය.

11. අමාත්‍යවරයා විසින් නියම කරන ලද උපරිම සිල්ලර මිල සහ එය ක්‍රියාත්මකවන දිනය පිළිබඳව සිල්ලර අලෙවිකරුවන්ට, තොග වෙළඳුන්ට සහ වෙනත් අදාළ පාර්ශවයන්ට දැනුම් දීම ආනයනකරුගේ හෝ දේශීය නිෂ්පාදකයාගේ වගකීම විය යුතු ය.

12. සෑම නිෂ්පාදකයකු හෝ ආනයනකරුවකු විසින් ම, එක් එක් ඖෂධ නිෂ්පාදනයක සිල්ලර ඒකක මිල එහි වෙළඳ අසුරුමේ සලකුණු කළ යුතු ය.

13. උපරිම සිල්ලර මිල ලෙස නියම කර ඇති මිලට වඩා වැඩි මිලකට යම් නිශ්චිත ඖෂධ නිෂ්පාදනයක් විකුණනු ලබන යම් තැනැත්තකු වරදකට වරදකරු විය යුතු ය.

14. ඉහත විධිවිධානවල කුමක් සඳහන් වුව ද, මිල නියම කිරීමේ කමිටුව විසින්, කලින් කලට, උපරිම මහජන සුබසිද්ධිය වෙනුවෙන් යම් නිශ්චිත ඖෂධ නිෂ්පාදනයක් හෝ ඖෂධ නිෂ්පාදන කාණ්ඩයක් සඳහා උපරිම සිල්ලර මිලක් නියම කිරීමේ අවශ්‍යතාවය සැලකිල්ලට ගනිමින් උපරිම සිල්ලර මිල ප්‍රතිශෝධනය කිරීමට අමාත්‍යවරයා වෙත නිර්දේශ ඉදිරිපත් කළ හැකි අතර යම් ඖෂධ නිෂ්පාදනයක ලියාපදිංචි සහතිකය දරන්නකුගෙන් හෝ දේශීය නිෂ්පාදකයකුගෙන් අදාළ දත්ත ඉල්ලා සිටිය හැකි ය.

15. මිල නියම කිරීමේ කමිටුව විසින්, කලින් කලට, යම් ලිත් වර්ෂයක් තුළ යම් ඖෂධ නිෂ්පාදනයක මිල ප්‍රතිශෝධන වාර ගණන පිළිබඳව තීරණය කරනු ලැබිය හැකි ය.

16. යම් ඖෂධ නිෂ්පාදනයක් ලියාපදිංචි කිරීම හෝ ලියාපදිංචිය අලුත් කිරීම සඳහා වන යම් ඉල්ලුම් පත්‍රයක එම ඖෂධ නිෂ්පාදනයේ පවතින උපරිම සිල්ලර මිල සහ අපේක්ෂිත උපරිම සිල්ලර මිල සමග උපරිම සිල්ලර මිල තීරණය කිරීමේ ක්‍රම දක්වා තිබිය යුතු ය. ඉල්ලුම් පත්‍රය අධිකාරියේ නිර්දේශය පරිදි විය යුතු ය. උචිත යම් අවස්ථාවක දී, මිල තීරණය කිරීමේ කමිටුව විසින්, යම් ඖෂධ නිෂ්පාදනයක මිල අධ්‍යයනය කිරීමෙන් පසුව, 2015 අංක 5 දරන ජාතික ඖෂධ නියාමන අධිකාරිය පනතේ 43 වන වගන්තිය යටතේ පිහිටුවන ලද ඖෂධ ඇගයීමේ කමිටුව වෙත උපරිම සිල්ලර මිල සම්බන්ධයෙන් එහි නිර්දේශ ලබා දිය හැකි ය.

17. මිල නියම කිරීමේ කමිටුව විසින්, ප්‍රවාහන, රක්ෂණ සහ වෙනත් යම් පිරිවැය ඇතුළුව පිරිවැය පිළිබඳ එය විසින් අවශ්‍යයයි සලකනු ලබන යම් තොරතුරු නිෂ්පාදකයන්ගෙන්, ආනයනකරුවන්ගෙන් හෝ වෙළඳුන්ගෙන් ඉල්ලා සිටිය හැකි අතර එම අවශ්‍යකරන ලද තොරතුරු මනා පැහැදිලි කිරීමක් සහ දත්ත සමග එම නිෂ්පාදකයන්, ආනයනකරුවන් හෝ වෙළඳුන් විසින් ලබා දිය යුතු ය.

18. යම් ඖෂධයක මිල හෝ එහි වෙළඳපල පැවැත්ම කෙරෙහි බලපාන්නා වූ සහ -

(අ) ඒකාධිකාර තත්ත්වයක් පැවතීම හෝ ඒකාධිකාර තත්ත්වයක් පැවතීමට ඉඩ තිබීම;
(ආ) ඒකාබද්ධ කිරීමේ තත්ත්වයක් ඇති කිරීම හෝ ඇති කිරීමට ඉඩ තිබීම;
(ඇ) යම් තරඟ විරෝධී චර්යාවක් ප්‍රචලිතව පැවතීම,

යන කාරණා සඳහා හේතු වන්නා වූ යම් ක්‍රියාවක් කිසිදු නිෂ්පාදකයකු, ආනයනකරුවකු හෝ වෙනත් යම් තැනැත්තකු විසින් සිදු නොකළ යුතු ය.

19. මෙම නියෝගවල විධිවිධාන උල්ලංඝනය කරනු ලබන යම් තැනැත්තකු වරදක් සිදු කරනු ලබන අතර 2015 අංක 05 දරන ජාතික ඖෂධ නියාමන අධිකාරිය පනතේ 131 වන වගන්තිය යටතේ අධිකරණය ඉදිරියේ නඩු පවරනු ලැබිය යුතු ය.

11 - 628

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.